මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council
අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com

කාර්යාලය / காரியாலயம் / Office - 081-2213097
ලේකම් / செயலாளர் / Secretary - 081-2213096
සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst. Secretary - 081-5631321
ෆැක්ස් / பெக்ஸ் / Fax - 081-2213082

මගේ අංකය / எனது இல. / My No. CPC/PSC/8/3/27/2026
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 2026.04.10.

මධ්‍යම පළාතේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සියළුම ආයතන ප්‍රධානීන් වෙත,

**<u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2026</u>**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ 2026 වාර්ෂික ස්ථාන මාරු අවසන් නියෝග අනුව, ස්ථාන මාරු ලද නිලධාරීන් සැලකිය යුතු ප්‍රමාණයක් නව සේවා ස්ථානයන් වෙත සේවයට වාර්තා කර නොමැති වීම නිසා මෙම කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ස්ථාන මාරු ක්‍රියාවලිය අකර්මන්‍ය වන බවත්, ස්ථාන මාරු නියෝග අනුව නව සේවා ස්ථානයන් වෙත නියමිත පරිදි නිලධාරීන් නිදහස් කරන ලද ආයතනයන්ට මේ හේතුවෙන් අහිතකර බලපෑමක් ඇතිවන බවත්, මෙම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත.

02. ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන ලද මෙම ගරු කොමිෂන් සභාව, මෙතෙක් නව සේවා ස්ථානයන් වෙත නිදහස් කර නොමැති, වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින නිලධරයන්, නව සේවා ස්ථානයන්හි රාජකාරි භාරගැනීමට හැකි වන පරිදි 2026.04.20 දිනට පෙර නිදහස් කල යුතු වන බවත්, එසේ වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව කටයුතු කිරීමට අපොහොසත් වන ආයතන ප්‍රධානීන් මෙම කොමිෂන් සභාවට කැඳවා නිදහසට කරුණු විමසීමටත්, ස්ථාන මාරු නොවන නිලධරයන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීම පිණිස ප්‍රධාන ලේකම් වෙත දැනුම් දීමටත්, 2026.04.09 දින මෙම කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදි.

03. ඒ අනුව 2026 වාර්ෂික ස්ථාන මාරු අවසන් නියෝග ලබා සිටින නිලධරයන් 2026.04.20 දිනට පෙර නව සේවා ස්ථානයන් වෙත නිදහස් කර යවන ලෙසත්, ඒසේ නව සේවා ස්ථානයන් වෙත සේවයට වාර්තා කරන නිලධරයන්ගේ තොරතුරු ඇතුළත් කිරීම සඳහා මෙම කොමිෂන් සභාව විසින් අදාළ ආයතනයන්හි නිල විද්‍යුත් තැපැල වෙත යොමු කරන ලද Google Spreadsheet හි අදාළ තොරතුරු 2026.04.22 දිනට පෙර යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලෙසත්, කාරුණිකව දන්වමි.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

පිටපත :
1. විගණකාධිපති - අ.කා.ස.